ප්‍රසම්පාදන දැන්වීම

දිස්ත්‍රික් මහ රෝහල මොනරාගල

01. මොනරාගල, දිස්ත්‍රික් මහ රෝහලේ අධ්‍යක්ෂ විසින් සෞඛ්‍ය හා ජන මාධ්‍ය අමාත්‍යාංශ අරමුදල් යටතේ ක්‍රියාත්මක පහත සඳහන් කර්මාන්ත ඉටු කිරීම සඳහා දේශීය ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි සුදුසුකම්ලත් ඉදිකිරීම් ආයතන හා කොන්ත්‍රාත්කරුවන් මගින් ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය යටතේ (NCB) යටතේ මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

ගොණු අංකය	කාර්යයේ නම	සිවිල් වැඩ වටිනාකම (රු.මි.) (වැට් රහිත)	ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අවශ්‍ය CIDA ශ්‍රේණිය	ලංසු ඇපකර ගාස්තු (රු.)	ඉදිකිරීම් කාල පරාසය (මාස)	ආපසු නොගෙවන ටෙන්ඩර් අයදුම්පත් ගාස්තු (රු.)
DGH/GOSL/NCB/Work /01/2026	Internal Painting & Improvement Work at ICU	9.8	C8,C7,C6	98,500.00	03	2,500.00
DGH/GOSL/NCB/Work /04/2026	Rehabilitation of Existing Internal Road	36.49	C6,C5,C4	365,000.00	09	3500.00
DGH/GOSL/NCB/Work /07/2026	Painting and Other Improvement work of Accident Emergency and ward Complex	44.50	C6,C5,C4	446,000.00	09	3500.00

1. මෙම රෝහලෙන් ලබා ගනු ලබන පෝරම මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුය.වෙනත් ආකාරයේ ආකෘති පත්‍ර මගින් ඉදිරිපත් කරන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
2. අධ්‍යක්ෂ,දිස්ත්‍රික් මහ රෝහල,මොනරාගල වෙත ලිඛිත ඉල්ලීමක් හා අදාළ ආපසු නොගෙවන ලංසු අයදුම්පත් ගාස්තු ගෙවා ලබා ගත් ලදුපත ඉදිරිපත් කොට 2026.07.30 සිට 2026.08.19 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව 9.00 සිට ප.ව 3.00 අතර වේලාව තුළ ලංසු ලේඛන රෝහලේ ගිණුම් අංශයෙන් ලබා ගත හැකි අතර ගෙවීමකින් තොරව ලංසු ලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.
3. ලංසුපත් 2026.08.20 දින පෙ.ව 10.30 ට පෙර මුල් පිටපත හා අනු පිටපත වෙන වෙනම මුද්‍රා තබා එම කවර එක් කවරයක බහාලා වම්පස ඉහළ කෙලවර අදාළ කොන්ත්‍රාත්තුවේ නම හා අංකය සඳහන් කර අධ්‍යක්ෂ,දිස්ත්‍රික් මහ රෝහල,මොනරාගල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ රෝහලේ ගණකාධිකාරි කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලීම කළ යුතුය.
4. ලංසු විවෘත කිරීම 2026.08.20 දින පෙ.ව 10.30ට රෝහලේ ශ්‍රවණාගාරයේදී සිදු කරන අතර ලංසුකරුට හෝ බලයලත් නියෝජිතයෙකු හෝ මේ සඳහා සහභාගී විය හැකිය.
5. පූර්ව ලංසු රැස්වීම 2026.08.11 දින පෙ.ව 10.30ට රෝහලේ ශ්‍රවණාගාරයේදී පැවැත්වෙන අතර එහිදී කර්මාන්ත පිළිබඳ පැහැදිලි කිරීම් ඉල්ලා සිටිය හැකිය.
6. ලංසුපත් සම්බන්ධව ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.
7. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට වැඩි විස්තර පහත දුරකථන අංක මගින් හෝ විද්‍යුත් තැපෑල මගින් ලබා ගත හැකිය.

අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් මහ රෝහල,
මොනරාගල.

දු.අංක - 0552276963
ෆැක්ස් - 0552276912
විද්‍යුත් තැපෑල - dir.dghmonaragala@health.gov.lk